

## පමා නොවී එම් අකුරට

# මෙදා පොටේ දුන්න බැටේ!!!

ලංකාවේ සමහරු මැරුණත් යූ.ඇම්.පී ය. තවත් සමහරු මැරුණත් සිරි ලංකා ය. පසුගිය සමයේ නිරතුරු සිදුවූ මන්ත්‍රීලා ගේ කුඩළු න්‍යායේ හෙවත් කටුසු න්‍යායේ පක්‍ෂ මාරු නිසාත්, ඔවුන් සමග ඒ පැත්තට, මේ පැත්තට ඇදෙන සපෝටර් වර්ගයේ ජනතාව නිසාත්, මේ උග්‍ර පාක්‍ෂිකත්වයේ තරමක අඩුවක් අද දකින්නට ලැබුනද, එදා හැටේ හැත්තෑවේ දශක වලදී තත්වය එසේ නොවීය. එක්සත් ජාතික පක්‍ෂය, පාර්ලිමේන්තුවේ ආසන 144 න් අටක් පමණක් ලබා අන්ත පරාජයකට ලක් වූ 1970 මැතිවරණයේ දී ද, ඔවුන් ගේ මුළු ඡන්ද සංඛ්‍යාව ඒ ආකාරයේ සමානුපාතික අඩුවීමකට භාජනය වී නොතිබුණි. ආසන ක්‍රමය බැහැරකොට සමානුපාතික ඡන්ද ක්‍රමයකට යාමට ජනාධිපති ජයවර්දෙන තීරණය කළේ මේ නිසා යැයි කියවේ. පමා නොවී එම් අකුරට කොලමෙන් අද මා සැරසෙන්නේ 1977 මහ ඡන්දය හා සම්බන්ධ කතාවක් ඔබට කියන්නටයි.

මේ මැතිවරණය පැවැත්වෙන විට මට අවුරුදු පහලොවක්වත් සම්පූර්ණ වී නොතිබුණි. ඡන්ද බලය තව දුර වූවද, දේශපාලනයික වශයෙන් අප තරමක් සංවේදී අය වීමු. එකම ප්‍රශ්ණයකට තිබුනේ අපේ දේශපාලන මතය අනිවාර්‍යයෙන්ම අපේ දෙමව්පියන්ගේ දේශපාලන මතිමතාන්තර මතම ගොඩ නැගුණු එකක් වීමයි. කොටින්ම කියතොත්, දෙමව්පියන් යූ.ඇම්.පී නම් දරුවෝ ද යූ.ඇම්.පී වූහ. දෙමව්පියන් සිරි ලංකා නම් දරුවෝ ද සිරි ලංකා වූහ. අවුරුදු දහඅට වෙනතුරු ඡන්ද බලය නොලැබෙන්නේ ඇයි දැයි මෙයින් මනාව සාධාරණීකරණය වේ.

වසර 1977 වන විට එවකට පැවති ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂයේ නායකත්වයෙන් යුතු වූ සමගි පෙරමුණු රජය වසර හතක ආණ්ඩු කාලයකින් පසු මුළු රට පුරාම බරපතල අප්‍රසාදයකට පත් වී සිටියහ. ඇත්තටම කියනවා නම් 1970 දී ඔවුන් බ්‍රිතාන්‍ය රැජින යටතේ පාලනය වූ ලංකාණ්ඩුවේ බලයට පත්වුනේ අවුරුදු පහක කාලයකටයි. නමුත් පසුව 1972 දී, ශ්‍රී ලංකා ජනරජය බිහි වීමෙන් පසු රජයේ ආයු කාලය නැවතත් අළුත් කරන ලදී. මේ කරුණද, මීට වඩා බරපතල වූ බඩුමිල යනාදී කරුණුද මේ මහජන අප්‍රසාදයට හේතු වී තිබුණි. රජය විසිරවීමේ නිවේදනය ගුවන් විදුලියෙන් ප්‍රචාරය කෙරෙනු ඇසෙන විට මා සිටියේ අපේ වැඩිහිටි වන්දනා නඩයක් සමග පලාබත්ගල පාරේ සමනොල කන්දේ සැහෙන දුරක් නැග ඉදිකටුපාන හරියට ලගාවෙමිනි. අතේ ගෙන ගිය රේඩියෝවකින් ප්‍රවෘත්තිය අසා ප්‍රීති ප්‍රමෝදයට පත් වූ පියදස බාප්පා, එහි සිටි තම මිතුරන් කිහිප දෙනෙකුද සමග එක්වී, "මෙදා පොටේ දෙනව බැටේ!" යනුවෙන් හඬ නැගූ අයුරු තවමත් මගේ මතකයේ ඇත.

ඡන්දය ඉතා උණුසුම් වූ එකක් විය. අප අත උඩින් දිනන බව අපි සක්සුදක් සේ දැන සිටියෙමු. ඒත් පැරදෙන්නට නියමිතව සිටි පිලේ සමහරුනට මෙය වැටහී තිබුණේ නැත. මගේ පන්තියේ සිටි උෂාද් පෙරේරා එවැන්නෙකි. වරද ඔහුගේ නොවේ. ඔහුගේ දෙමව්පියන්ගේ ය. මා කලින් කිව්වාක් මෙන් නිවරදි දේශපාලන අවබෝධයක් නොමැති පොඩි එවුන් වූ අප, නිරායාසායෙන්ම පිළිගත්තේ අපේ දෙමව්පියන් ඇදහූ දෙයයි. උෂාද් ගේ පියා ඉහල පෙලේ සිරි ලංකා ආධාරකරුවෙකි. රජයට අයිති මාධ්‍ය ආයතනයක නිලයක් දැරූ පිළිගත් වෘත්තිකයෙකු වූ ඔහුට, ඇත්තටම කියනවා නම්, ආණ්ඩු පෙරලියෙන් පසු රැකියාවද අහිමි විය. ආනන්දයේ ගොඩනැගිල්ලක තුන්වන මහලේ තිබූ අපේ පන්ති කාමරයේ උෂාද් සිටියේ මැද තීරුවේ මුල් පෙලේ එක් කොනක ය. මගේ අසුන හරියටම ඔහු පිටු පසින් විය. ඡන්දයට ආසන්න දිනවල, පාඩම් අතර ඉඩ කඩක් ලැබුනු හැම මොහොතකම පාහේ, අපට ඡන්දය ගැන කතාවට ඉඩ කඩ ලැබුණි.

උෂාද් පැරදීමට නියමිත වූ ආණ්ඩු පක්‍ෂයේ ය. මා ජය ගැනීමට නියමිතව සිටි විරුද්ධ පක්‍ෂයේය. එක් දිනක අපේ මහ මැතිවරණය පිළිබඳ කතාවක් අවසාන වූයේ අප දෙදෙනා අතර ඡන්ද ඔට්ටුවකිනි. ඔට්ටුව වැඩි ගණනකට නොවේ. රුපියල් පහකටය. වෙනත් වචන වලින් කියනවා නම් ආනන්දයේ කැන්ටිමේ බිත්තර පාන් දහයක මිල ය. නැතහොත්, පොදු ජන ආහාරය වූ පාන් ගෙඩි පහක මිල ය.

මහ ඡන්දයෙන් යූඇම්පීය ආසන 75 කට වඩා දිනුවොත් උෂාද් මට රුපියල් පහක් ගෙවිය යුතුය. යූඇම්පී ආසන ගනන 75 වඩා අඩු වූවොතින් මා උෂාද් ට රුපියල් පහක් ගෙවිය යුතුය. මෙම ආසන ගණන එදා වූ ආසන 144 පාර්ලිමේන්තුවේ රජයක් පිහිටුවීම සඳහා අවශ්‍යවූ අවම සරල බහුතරය විය. මේ දිනවල රිවිරැස පත්‍රය මගින් එක් එක් පක්‍ෂයට ලැබෙන ආසන ගණන ගැන කියන්නට තරගයක් විය. ඒ කූපන් පිරවීමේදී අපි යූඇම්පීය ට ආසන සියයකට වැඩියෙන් ලැබෙන බව යෙදුවෙමු. එහෙත්, මා උෂාද් සමග ඇල්ලුවේ අවදානමෙන් තොර ඔට්ටුවකි.

ඡන්ද ප්‍රතිඵල අනුව යූ.ඇම්.පී. ය ට තුනෙන් දෙකක බහුතරයක් හිමිවූ අතර මම ඔට්ටුව උඩින් ම දින්නෙමි.

මෙදා පොටේ දුන්න බැටේ!

පසු සටහනඃ

වසර තිහක් ගතවී ජීවිතයේ මැදි වියට එළැඹ ඇති අපේ දේශපාලන අදහස් ද අද වන විට සහමුලින්ම වෙනස් වී ඇති බව කිවයුතු නොවේ. මට නම් සත්‍යය වැටහෙන්නට පටන් ගත්තේ අවුරුදු දහ අට ලැබීමටත් පෙරය. මා උසස් පෙල විභාගයට සූදනම් වෙන සමයේ පැවති 1980 ජූලි වැඩවර්ජනය අනුසාරයෙන් සියළු මොහඳුර මැකුණි. ඊලඟ වසරේ විශ්ව විද්‍යාලයට යන විට මා තරමක දේශපාලන විඥාණයකින් යුතු වෙනස් පුද්ගලයෙකි.

මා මෙන්ම උෂාද් ද දැන් වාසය කරන්නේ ඕස්ට්‍රේලියාවේ ය. පසුගිය දිනක ඔහුට දුරකතනයෙන් කතා කල මා පරණ සිදුවීම් නැවත මතක් කර අහිංසක සතුටක් ලබා අවසානයේ ඔහුගේ දේශපාලන අදහස් ගැන විමසීමි. ඔහු එදාත් සිරි ලංකා ය. අදත් සිරි ලංකා ය.

එදා යූ.ඇම්.පී ය පැත්තට ඔට්ටු අල්ලා රුපියල් පහක් දිනූවද, එම පක්‍ෂයට කිසි දිනක ඡන්දය නොදුන් මම අද කිසිදු පක්‍ෂයක් නැතිව දේශපාලන වශයෙන් අනාථ වී සිටිමි.

රසික සූරියආරච්චි

[rasika.suriyaarachchi@gmail.com]

---

26 වන පිටුවෙන් ( ඩී බී කුරුප්පු ගේ)

වචනයක අගට නොයෙදෙන බව කොපමණ වාර ගණනාවක් පුවත් පත් ලිපි මගින් අපි පෙන්වා දී ඇත්තෙමු ද?

අද සාහිත්‍ය සම්මාන ලැබෙන්නේ ද වැරදි සිංහල ඇති පොතට ය. සරසවි ඇදුරන් ලියන්නේ ද වැරදි සිංහල ය.

පුවත්පත් ලිපි දහයක් කියෙව්වොත් නවයකම ඇත්තේ වැරදි සිංහල ය. තොග ගණනින් බිහිවන බොහෝ පරිවර්තන කෘති ලියැවී ඇත්තේ ද කියවන විට බඩ දඟලන සිංහලෙනි. ගිය වසරේ වැඩියෙන්ම අලෙවි වුණ පරිවර්තිත කෘතිය ලෙස හැඳින්වෙන රංජිත් කුරුප්පු ගේ "කාන්තාරයේ කුසුම" පොතේ සිට අවසන් වරට මට කියවන්නට ලැබුණ නිරූපා රුද්‍රිගු ගේ "ඊවා ලූනා කී කතන්දර" පොත දක්වා සෑම පරිවර්තිත කෘතියකම පිටුවක් පිටුවක් පාසා ඇත්තේ වැරදි සිංහල ය. අවම වශයෙන් උක්ත ආඛ්‍යාත සම්බන්ධය වත් රැක ගන්නට මේ ලේඛක ලේඛිකාවන් උත්සාහ දරා නැත.

සියල්ල උඩු යටිකුරු වෙමින් තිබියදී අප කළ යුත්තේ කුමක් ද? නිහඬව බලා සිටිමු ද? එරෙහිව හඬක් නගමු ද? බස වෙනුවෙන් වෙහෙසෙන ඩී බී කුරුප්පු, ඩී එෆ් කාරියකරවන වැනි වියතුන් ට පමණක් මේ කාරිය බාර දී බලා සිටිමු ද? අද දවසේ අප කළ යුතු වන්නේ මහන්තත්ත කම පසෙක ලා හෝඩියේ සිට නැවත සිංහල ඉගෙන ගැනීම නොවන්නේ ද? ඒ වෙනුවෙන් යම් කැපවීමක් කරන්නට අපට නොහැකි ද?

මේ පරිසරයේ දී නිවැරදි සිංහල ඉගෙනගන්නට යම් තරමින් හෝ උත්සාහයක් ගන්නා කීප දෙනෙකු හෝ සිටින බව අපි දනිමු. ඔවුන් වෙනුවෙන් අත්වැලක් සපයන්නට හැකි සිංහල ව්‍යාකරණ පොතක් සොයා ගැනීම ඉතා අපහසුව පවතින යුගයක ඩී බී කුරුප්පු මහතාගේ නවතම කෘතිය වන "සරළ සිංහල වියරණ විදි" පොත කතරකට වට දිය බිඳක් සේ දනෙන්නේ එනිසා ය.

බසක මහිම
උක්තාඛ්‍යාත සම්බන්ධය
පුරුෂ හා ලිංග භේදය
ආඛ්‍යාතය - ක්‍රියා පදය
කාල ත්‍රය
උක්තානුක්ත භේදය
කර්තෘ කාරක හා කර්ම කාරක වාක්‍ය
අව්‍යය පද
විශේෂණ
කෘදන්ත හා තද්ධිත
සමාස විභක්ති හා සන්ධි
අක්ෂර වින්‍යාසය
පද බෙදීම
බසක සවිය රකින වචන
භාෂා ප්‍රයෝග

යන මූලික මාතෘකා යටතේ ඉතා වැදගත් කරුණු රාශියක් සාකච්ඡා කිරීමට කුරුප්පු මහතා ගත් උත්සාහය පැසසිය යුතු ය.

අද මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා සිංහලෙන් අදහස් ප්‍රකාශ කරන බොහෝ දෙනා උක්ත ආඛ්‍යාත සම්බන්ධතාව හෝ නොසළකන තරමට ව්‍යාධිය ඔඩු දුවා ඇත. දැන් බොහෝ දෙනා ලියන්නේ "මා ගියෙමි" කියා ය. මා යනු උත්තම පුරුෂ ඒක වචනය වන "මම" යන්නේ අනුක්ත ස්වරූපය බව කියා දෙන්නේ තුනේ පන්තියේදී ය. මෙතරම් සරළ රීතියක් පවා නොසළකන්නේ නොදන්නා කමට ද? නොසැළකිල්ලට ද?

පුදුමය මේ නොසැළකිල් දක්වන්නේ අපේ මව් බසට පමණක් වීම ය. ඉංගිරිසි භාෂාවේ නීති රීති හා සියලු සම්ප්‍රදායන් සියල්ල අපූරුවට රකින අපේ ඇත්තන් අපේ මව් බසට දක්වන මේ කුඩම්මාගේ සැළකිල්ල අපේ යටත් විජිතවාදී මානසිකත්වයේ ම කොටස් නොවේ ද?

නොදන්නා කමට වරද්දන්නා වරද නිවැරදි කරගන්නට වැර වෑයම් කරයි. වැරදි නිවැරදි කරගන්නට කැමති කෙනෙක් වෙත් නම් ඩී බී කුරුප්පු මහතා ගේ "සරල සිංහල වියරණ විදි" පොත පරිශීලනය කළ යුතුම ය. මේ අධ්‍යයනය ඇරඹිය යුත්තේ උක්ත ආඛ්‍යාත සම්බන්ධතාව පිළිබඳ මූලික වැටහීමක් ලබා ගනිමින් ය. කුරුප්පු මහතා සිය පොතේ "උක්තාක්ඛ්‍යාත සම්බන්ධය" පරිච්ඡේදයෙන් උත්සහ කරන්නේ මේ මූලික දැනීම ලබා දීමට ය.

මේ මූලික අඩිතාලම සකස් කරන අතරේ ක්‍රම ක්‍රමයෙන් භාෂාවේ විවිධ පැති කරා අප ගෙන යන්නට ඔහු සමත් වෙයි.

අද ගුවන් විදුලි සේවා ඔස්සේ "ඔහු දේශනා කරනු ලැබුවේය" "ඇමතිවරයා විවෘත කරනු ලැබුවේය" වැනි විසුලු වාක්‍ය කියනු අපට නිතර ඇසෙයි. "ඔහු දේශනා කළේ ය" "ඇමතිවරයා විවෘත කළේ ය" යනුවෙන් නිවැරදිව කිව හැකිව තිබියදී අනවශ්‍ය "ලබ" ධාතුවක් ගැට ගසන්නේ මන්දැයි වටහා ගත හොහැකිය. මේ වරද නිවැරදි කරගන්නා මෙන් කුරුප්පු මහතා සිය ලිපි ලේඛණ මගින් පෙන්වා දුන්නේ වරක් දෙවරක් නොවේ. එහෙත් අදත් අපේ ඇත්තෝ කිසිම හිරිකිතයක් නැතිව වාක්‍ය වලට "ලබ" ධාතුව එල්ලති.

ව්‍යාධියක් බවට පත්ව ඇති අනෙක් වරද නම් අනවශ්‍ය ලෙස "විසින්" පදය යෙදීම යි. අපේ සමහර ලේඛකයන් නිවේදකයන් "ඔහු ගෙය සෑදුවේය" කියන්නේ නැත. ඒ වෙනුවට "ඔහු විසින් ගෙය සෑදුවේය" කියා අපබ්‍රංසයක් ලියති. කියති. "ඔහු විවෘත කළේ ය" නොකියා "ඔහු විසින් විවෘත කළේ ය" කියති.

මේ විකාර යෙදුම් වලට හේතුව කර්ම කාරක හා කර්තෘ කාරක වාක්‍ය පිලිබඳ නිසි වැටහීමක් නොමැති කම ය. මේ කරුණ සිය පොතේ ඉතා නිවැරදි ලෙස හා සරළ ලෙස උදාහරණ ද සහිතව සාකච්ඡා කරන්නට කුරුප්පු මහතා සමත් වෙයි.

බස පිලිබඳ යම් හැදෑරීමක් කරන්නට ඇවැසි විටෙක සරළ සිංහල ව්‍යාකරණ පොතක් සොයා ගැනීම කෙතරම් අපහසු කාර්යයක්දැයි දන්නෝ දනිති. ඩී බී කුරුප්පු මහතා ඉතා නැණවත් ලෙස මේ පුරවා ඇත්තේ ඒ හිඩැසයි. එයින් නිසි ප්‍රයෝජන ගැනීම ඇත්තේ අප අත ය.

නොදන්නා කම පිළිනොගන්නා, තමන් නොදන්නා බව නොදන්නා, ඊනියා ලේඛකයෝ සහ මාධ්‍යකරුවෝ සිංහලය විනාශ කරමින් සිටිති. සියල්ල නාය යමින් තිබෙයි. කුරුප්පු මහතා මේ කරන්නේ උඩු ගං බලා පිහිනීමක් වැනි අපහසු කටයුත්තකි.

ඩී බී කුරුප්පු මහතා ගේ "සරල සිංහල වියරණ විදි" පොත සිංහල භාෂාව පිළිබඳ නිවැරදි දැනුමක් ලබා ගන්නට උත්සාහ කරනා සියල්ලන්ට ම ශක්තිමත් අත්වැලක් වනු නියත ය.